# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

## හෙද සේවා/ සාත්තු සේවා/ ඉංග්‍රීසි භාෂා පුහුණු උපදේශක උපදේශිකාවන් කාර්යාංශ පුහුණු සංචිතය වෙත ලියාපදිංචි කරගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශ රැකියා අපේක්ෂිතයින් වෙනුවෙන් මෙහෙයවනු ලබන සාත්තු සේවා පුහුණු පාඨමාලාවන්හි ඉගැන්වීමේ කටයුතු සඳහා සුදුසුකම්ලත් පුහුණු උපදේශක උපදේශිකාවන් වශයෙන් සිංහල/ දමිළ මාධ්‍යය කාර්යාංශ පුහුණු සංචිතයට ලියාපදිංචි කර ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### මූලික සුදුසුකම්

**01. හෙද සේවක පුහුණු උපදේශක / උපදේශිකා**

- හෙද සේවය පිළිබඳ උපාධියක් හදාරා තිබීම හා පිළිගත් ආයතනයක හෙද සේවා ඉගැන්වීමේ හා අධීක්ෂණය කිරීමේ පාඨමාලාවක් හදාරා තිබීම.
- අවම වශයෙන් හෙද සේවාවේ වසර 2 ක පළපුරුද්ද.
- වයස අවුරුදු 25 ත් 60ත් අතර (විශ්‍රාමික අයවලුන්ද සලකා බලනු ලැබේ)

**02. සාත්තු සේවක පුහුණු උපදේශක / උපදේශිකා**

- පිළිගත් ආයතනයක හෙද සේවාව පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.
- අවම වශයෙන් සාත්තු සේවාවේ වසර 2 ක පළපුරුද්ද.
- වයස අවුරුදු 25ත් 60 ත් අතර ( විශ්‍රාමික අයවලුන්ද සලකා බලනු ලැබේ)

**03. ඉංග්‍රීසි භාෂා උපදේශක / උපදේශිකා**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ
- උපාධි පාඨමාලාවේ විෂයක් ලෙස ඉංග්‍රීසි භාෂාව හදාරා තිබීම
- පිළිගත් දේශීය හෝ විදේශීය අධ්‍යාපන ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම සහ
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ගුරුවරයෙක් වශයෙන් හෝ උපදේශකයෙක් වශයෙන් අවම වශයෙන් වසරක සේවා පළපුරුද්දක් තිබීම.

### වෙනත් සුදුසුකම්

- භාෂා හැකියාව (සිංහල/ දමිළ / ඉංග්‍රීසි)
- මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම අත්‍යාවශ්‍ය වේ.

### ඉගැන්වීමේ කුසලතාවය

සම්මුඛ පරීක්ෂණයේ දී ඉගැන්වීමේ කුසලතාවය සහ අනුගමනය කරන ක්‍රමවේදය පිළිබඳව ප්‍රායෝගිකව පරීක්ෂා කරනු ලැබේ.

### පුහුණු උපදේශක සංචිතය වෙත ලියාපදිංචි කර ගැනීමේ කොන්දේසි

සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගනු ලබන උපදේශකයින් කාර්යාංශ පුහුණු උපදේශක සංචිතය වෙත ලියාපදිංචි කරනු ලබන අතර, මෙය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ස්ථිර තනතුරක් සඳහා කරනු ලබන බඳවා ගැනීමක් නොවන බව අවධාරණය කරනු ලැබේ.

- සේවා පැවරුම් ක්‍රමයට රාජකාරි පවරනු ලැබේ.
- පැය පදනම මත ගෙවීම් සිදු කරනු ලැබේ.
- සේවා අවශ්‍යතාවය මත දිවයින පුරා පිහිටි කාර්යාංශ පුහුණු මධ්‍යස්ථානවල සේවය කිරීමට හැකියාව තිබිය යුතුය.

### අයදුම්පත් යොමු කළ යුතු ආකාරය

- ඔබගේ අයදුම්පත 2023/1 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුය.
- තනතුරු දෙකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.
- ඔබගේ ඉල්ලුම්පත බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි "පුහුණු උපදේශක උපදේශිකාවන් බඳවා ගැනීම .. ..............................................," යනුවෙන් සඳහන් කළ යුතුය
  (තනතුර සඳහන් කරන්න)

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පරිපාලන හා මානව සම්පත්,**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල / දුරකථන අංක - 0112864127/0112887594**
**E-mail - dgm_admin@slbfe.lk**